# සන්තති

# SANTHATHI


සංස්කරණය

එච්.එම්. සමන් මධු ශාන්ත් (ඉතිහාස අධ්‍යයන අංශය)

බී.ජී.ජී. චමිලා සිරිවර්ධන (දර්ශන අධ්‍යයන අංශය)

එස්.පී. දිනේෂා රසාංජලී සේනානායක (පුරාවිද්‍යා අධ්‍යයන අංශය)



ISSN - 18804652

පළමුවන මුද්‍රණය - 2011

ප්‍රකාශනය - සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්ව විද්‍යාලය.

මුද්‍රණය - ඩී.එන්. ප්‍රින්ටර්ස්, වේවැල්දූව, කැලණිය.

# පුස්තකාල ස්වයංක්‍රීය මෘදුකාංග පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

[illegible]

වර්තමානයේ අප ජීවත් වනුයේ තොරතුරු මූලික සමාජයක. මෙකී සමාජය තුළ පුද්ගලයා නිරන්තර තොරතුරු සෙවීමෙහි යෙදෙයි. මෙකී පාඨකයා තොරතුරු මධ්‍යස්ථාන, පුස්තකාල යනාදියෙන් අපේක්ෂා කරනුයේ ඉක්මනින් හා නිවැරදිව ඔහුගේ තොරතුරු අවශ්‍යතා පූර්ණය කිරීමයි. තොරතුරු පිපාසාවෙන් මද්දලව පුස්තකාලය වෙත හෝ තොරතුරු මධ්‍යස්ථානය වෙත පැමිණෙන පාඨකයාගේ තොරතුරු අවශ්‍යතාවය ඉටු කර දීමට පුස්තකාලයාධිපති සමත් නොවන්නේ නම් එවිට පාඨකයා තොරතුරු අවශ්‍යතාවය ඉටු කර ගැනීමට පුස්තකාලය වැනි ආයතන තෝරා නොගනු ඇත. එනම් පාඨකයා පුස්තකාලය ප්‍රතික්ෂේප කිරීමට අවස්ථාව උදා වේ. එසේ ම තොරතුරු සැපයීමේ දී අවශ්‍ය වේලාවට, අවශ්‍ය තොරතුරු, අවශ්‍ය ස්වරූපයන්ගෙන් සැපයීම ද පාඨකයා අපේක්ෂා කෙරේ. මෙහි දී පුස්තකාලයේ ක්‍රියාකාරිත්වය පවත්වා ගෙන යන ආකාරය පාඨක තොරතුරු අවශ්‍යතා සන්තර්පනය කෙරෙහි බලපෑම් කරනු ලබයි. එනම් පුස්තකාලයේ හෝ තොරතුරු මධ්‍යස්ථානයේ කටයුතු අත්හුරු ක්‍රමයට පවත්වා ගෙන යන්නේ නම් ඉක්මන් තොරතුරු අවශ්‍ය පාඨකයාට තොරතුරු සැපයීම විධිමත් ව කිරීමට අපොහොසත් වනු ඇත. මේ නිසා වර්තමානය වන විට බොහෝ පුස්තකාල තොරතුරු සමාජයට ගැළපෙන පරිදි පුස්තකාල කටයුතු ස්වයංක්‍රීයකරණය කිරීමට යොමු වී ඇති බැව් පෙනේ.

යම් කාර්යයක් කිරීමේ දී එම කාර්යය කිරීමට අත්හුරු ක්‍රමයෙන් ඉවත් ව යාන්ත්‍රික භාවිත කරන්නේ නම් එය ස්වයංක්‍රීයකරණය ලෙස සරළ ව ම හඳුනාගත හැකිය. මුල් කාල වලදී සෑම කාර්යයක් ම පාහේ අත්හුරු ක්‍රමයට පවත්වා ගෙන ගිය අතර තාක්ෂණය දියුණු වීම, පුද්ගල අවශ්‍යතා සීඝ්‍රයෙන් දියුණු වීම යනාදී කරුණු මුල් කරගෙන අත්හුරු ක්‍රමයේ සිට ස්වයංක්‍රීයකරණය වෙත පරිවර්තනය වීමට අවශ්‍යතාවය පැන නැගුණි. මෙහි දී මූලිකව ම තොරතුරු පදනම් කරගත් සමාජයක කාර්යක්ෂම තොරතුරු සේවාවක් පවත්වා ගෙන යාම අත්‍යවශ්‍ය වන අතර මෙහි දී පාඨකයාගේ අවශ්‍යතා ඉක්මනින් පූර්ණය කිරීමට පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන පවා මෙකී ස්වයංක්‍රීයකරණ සංකල්පය වෙත යොමු වූ බැව් පෙනේ. ස්වයංක්‍රීයකරණය වර්තමානය වන විට ජනප්‍රිය සංකල්පයක් වන අතර, නමුත් පුස්තකාල එකී සංකල්පයෙන් ද ඉවත් ව සංඛ්‍යාංක පුස්තකාල නිර්මාණය සඳහා යොමු වී ඇති බැව් දක්නට ලැබේ. ලෝකයේ ප්‍රවණතාව එසේ වුවද වර්තමානයේ දී පවා ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක පුස්තකාල ස්වයංක්‍රීයකරණය ප්‍රාථමික අවධියක පැවතින බව දක්නට ලැබේ.